
# 6 ශ්‍රේණිය



# එදිනෙදා ජීවිතයේ දී ශක්තිය

- අද දවසේ ඔබ විසින් කරන ලද විවිධ ආකාරයේ කාර්ය පහක් ලියන්න.

a. ...........................................................

b. ...........................................................

c. ...........................................................

d. ...........................................................

e. ...........................................................

- අද දවසේ ඔබ විසින් කරන ලද විවිධ ආකාරයේ කාර්ය පහක් ලියන්න.

a. මිදුල අතු ගෑම

b. බයිසිකල් පැදීම

c. පොත කියවීම

d. රූපවාහිනිය නැරඹීම

e. මල්වලට ජලය දැමීම

- එම එක් එක් කාර්ය කිරීම සඳහා ඔබ යොදා ගන්නා ලද දෑ සඳහන් කරන්න.

a. ..........................................................
b. ..........................................................
c. ..........................................................
d. ..........................................................
e. ..........................................................

- එම එක් එක් කාර්ය කිරීම සඳහා ඔබ යොදා ගන්නා ලද දෑ සඳහන් කරන්න.

a. මිදුල අතු ගෑම - මිදුල, ඉදල, සිරුර,ශක්තිය

b. බයිසිකල් පැදීම - බයිසිකලය, සිරුර, ශක්තිය

c. පොත කියවීම - පොත, ඇස, ශක්තිය

d. රූපවාහිනිය නැරඹීම - රූපවාහිනිය, දුරස්ථ පාලකය, ඇස, පුටුව, ශක්තිය

e. මල්වලට ජලය දැමීම - මල්, ජලය, වතුර බටය හෝ බාල්දිය , ශක්තිය

- සෑම අවස්ථාවකදීම ඔබ ශක්තිය යොදා ගෙන තිබේ ද?

ඔව්

- ඔබ විසින් කරන ලද විවිධ කාර්යයන් ඉටු කිරීමට හැකියාවක් ලැබුනේ ශක්තිය භාවිත වූ නිසාය.

- ශක්තිය ලෙස හඳුන්වනු ලබන්නේ කාර්ය කිරීමට ඇති හැකියාවයි.

- විවිධ ක්‍රියාකාරකම් ඇසුරින් කාර්යය ඉටු කර ගැනීමට යොදා ගන්නා ශක්ති ප්‍රභේදය කුමක් දැයි හඳුනා ගත හැකිය. ඒ සඳහා පහත ක්‍රියාකාරකම් පිළිබඳව අවධානය යොමු කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. එළිමහන් ස්ථානයකට ගොස් සිසුන් සිව්දෙනෙකු ලවා 2 kg පමණ ස්කන්ධයෙන් යුතු ගලක් විසි කිරීමට සැලස්වූ විට එක් එක් සිසුවා විසින් ගල විසි කරන ලද දුර පහත සඳහන් වේ.

| ශිෂ්‍යයා /ශිෂ්‍යාවගේ නම | විසි කරන ලද දුර ( m ) |
|---|---|
| A | 2.5 m |
| B | 3.0 m |
| C | 3.5 m |
| D | 3.0 m |

i. A සහ C සිසුන් දෙදෙනා විසින් ගල විසි කරන ලද දුර අසමාන වීමට හේතුව කුමක් ද?

- A සහ C සිසුන් දෙදෙනා යෙදවූ ශක්තිය අසමාන වීම

| ශිෂ්‍යයා /ශිෂ්‍යාවගේ නම | විසි කරන ලද දුර ( m ) |
|---|---|
| A | 2.5 m |
| B | 3.0 m |
| C | 3.5 m |
| D | 3.0 m |

ii. B සහ D සිසුන් දෙදෙනා විසින් ගල විසි කරන ලද දුර සමාන වීමට හේතුව කුමක් ද?

- B සහ D සිසුන් දෙදෙනා යෙදවූ ශක්තිය සමාන වීම

| ශිෂ්‍යයා /ශිෂ්‍යාවගේ නම | විසි කරන ලද දුර ( m ) |
|---|---|
| A | 2.5 m |
| B | 3.0 m |
| C | 3.5 m |
| D | 3.0 m |

iii. ගල විසි කිරීමට යොදාගත් ශක්ති ප්‍රභේදය කුමක් ද?

- සිරුරේ තිබූ රසායනික ශක්තිය

02. විශාලක කාචයක් භාවිත කර සූර්ය තාපය නාභිගත කර වියළි ශාක පත්‍රයකට හෝ කඩදාසි කැබැල්ලකට ගිනි අවුලුවාලිය හැකිය.



i. කරන ලද කාර්යය කුමක් ද?

කඩදාසියට ගිනි ඇවිලවීම

ii. කාර්යය සිදු කළ ශක්ති ප්‍රභේදය කුමක්ද ?

- තාප ශක්තිය

iii. එම ශක්ති ප්‍රභේදය ලබා දුන් ප්‍රභවය කුමක් ද?



- සූර්යයා

03. තුනී කඩදාසිවලින් බෝට්ටුවක් සාදා එහි යටි පැත්තට ලෝහ ඇමුණුම් කටු දෙකක් සවි කර තුනී කාඩ්බෝඩ් කැබැල්ලක් මත තබා ඊට යටින් චුම්බකයක් චලනය කිරීමෙන් බෝට්ටුව චලනය කළ හැකිය.

i. කාර්යය සිදු කළ ශක්ති ප්‍රභේදය කුමක්ද ?

**චුම්බක ශක්තිය**

ii. එම ශක්ති ප්‍රභේදය ලබාදුන් ප්‍රභවය කුමක් ද?

**චුම්බකය**

04. පොල් කොළ හෝ කඩදාසි භාවිතයෙන් සුළං පෙත්තක් නිර්මාණය කර සුළඟට යොමු කිරීමෙන් හෝ එය රැගෙන දිවීමෙන් සුළං පෙත්ත කරකැවිය හැකිය.







i. සිදු වූ කාර්යය කුමක් ද?

**සුළං පෙත්ත කරකැවීම.**

ii. කාර්යය සිදු කළ ශක්ති ප්‍රභේදය කුමක්ද ?







සුළං ශක්තිය/සුළඟේ ශක්තිය

iii. එම ශක්ති ප්‍රභේදය ඇතිවීමට මූලික වූ ප්‍රභවය කුමක් ද?








සූර්යයා


05. සූර්ය උඳුනක ආකෘතියක් තනා ජලය රත් කිරීම සිදුකළ හැකිය.

පහත රූපයේ ආකාරයට 50 cm දිග කම්බි භාවිතයෙන් පරාවලයක හැඩය ඇති මුහුණත විෂ්කම්භය 35 cm වූ කම්බි රාමුවක් සකසා ගෙන, ඊට සම්බන්ධ කළ බිස්ටල් බෝඩ් එකක් මත ඇලුමිනියම් පටලයක් අලවා ගැනීම මගින් සූර්ය උඳුනක් සාදාගත හැකිය.






ඇලුමිනියම් පටල මගින් කුඩා බඳුනක් ද සකස් කරගෙන සූර්ය උඳුනෙහි සූර්ය තාපය බඳුනට එල්ල වන සේ තබා උෂ්ණත්වමානයක් භාවිතයෙන් ජලයේ උෂ්ණත්ව වෙනස මැන ගත හැකිය.







i. මිනිත්තු කිහිපයකට පසු ජලයේ උෂ්ණත්ව වෙනස කෙසේ විය හැකි දැයි සඳහන් කරන්න.

ජලයේ උෂ්ණත්වය ඉහළ යයි.

ii. මෙහි සිදු වූ කාර්යය කුමක් ද?






- ජලය රත් කිරීම

iii. කාර්යය සිදු කළ ශක්ති ප්‍රභේදය කුමක් ද?

(සූර්යයාගේ) තාප ශක්තිය

iv. එම ශක්ති ප්‍රභේදය ලබාදුන් ප්‍රභවය කුමක් ද?

සූර්යයා

## ශක්ති ප්‍රභව සහ ඒවායේ භාවිත

01. පෘථිවියට ශක්තිය සපයන ප්‍රධාන ප්‍රභවය සූර්යයා ය.

සූර්යයාගේ ශක්තියෙන් සෘජුවම කාර්යය කර ගත හැකි ය.

සූර්යයාගේ ශක්තිය වෙනත් ශක්ති ප්‍රභේදයක් බවට පරිවර්තනය කර ප්‍රයෝජන ලබා ගත හැකි ය.

අප භාවිත කරන අනෙක් ශක්ති ප්‍රභව ගොඩ නැගී ඇත්තේ ද ස්වභාවිකම සූර්ය ශක්තිය එහි ගබඩා වීමෙන් ය.

i. සූර්ය ශක්තිය මගින් සෘජුවම කාර්යය කරගන්නා අවස්ථා තුනක් සඳහන් කරන්න.









සූර්ය උදුනකින් ආහාර පිසීම

සූර්ය ජල තාපකයෙන් ජලය රත් කිරීම.


i. සූර්ය ශක්තිය මගින් සෘජුවම කාර්යය කරගන්නා අවස්ථා තුනක් සඳහන් කරන්න.





සූර්ය තාප වියලනය මගින් ආහාර වියළීම.

ii. සූර්ය ශක්තිය භාවිත කරමින් ශක්තිය පරිවර්තනය කර ප්‍රයෝජනයට ගන්නා පහත අවස්ථා නම් කරන්න.







ආලෝක ශක්තිය විද්‍යුත් ශක්තිය බවට පත් කර ගුවන් යානා ගමන් කිරීම.

ii. සූර්ය ශක්තිය භාවිත කරමින් ශක්තිය පරිවර්තනය කර ප්‍රයෝජනයට ගන්නා පහත අවස්ථා නම් කරන්න.





ආලෝක ශක්තිය විද්‍යුත් ශක්තිය බවට පත් කර කෘත්‍රිම චන්ද්‍රිකා /අභ්‍යවකාශ යානා ගමන් කිරීම.

ii. **සූර්ය ශක්තිය භාවිත කරමින් ශක්තිය පරිවර්තනය කර ප්‍රයෝජනයට ගන්නා පහත අවස්ථා නම් කරන්න.**






**ආලෝක ශක්තිය විද්‍යුත් ශක්තිය බවට පත් කර බෝට්ටු සහ නැව් ගමනා ගමනය කිරීම.**


ii. **සූර්ය ශක්තිය භාවිත කරමින් ශක්තිය පරිවර්තනය කර ප්‍රයෝජනයට ගන්නා පහත අවස්ථා නම් කරන්න.**





**ආලෝක ශක්තිය විද්‍යුත් ශක්තිය බවට පත් කර මෝටර් රථ ගමන් කිරීම.**

ii. **සූර්ය ශක්තිය භාවිත කරමින් ශක්තිය පරිවර්තනය කර ප්‍රයෝජනයට ගන්නා පහත අවස්ථා නම් කරන්න.**





**ආලෝක ශක්තිය විද්‍යුත් ශක්තිය බවට පත් කර ජාතික විදුලි ජාලයට එකතු කිරීම**

ii. සූර්ය ශක්තිය භාවිත කරමින් ශක්තිය පරිවර්තනය කර ප්‍රයෝජනයට ගන්නා පහත අවස්ථා නම් කරන්න.



ආලෝක ශක්තිය විද්‍යුත් ශක්තිය බවට පත් කර විදුලි පහන් දැල්වීම.

ii. **සූර්ය ශක්තිය භාවිත කරමින් ශක්තිය පරිවර්තනය කර ප්‍රයෝජනයට ගන්නා පහත අවස්ථා නම් කරන්න.**






**ආලෝක ශක්තිය විද්‍යුත් ශක්තිය බවට පත් කර නිවෙස්වල විදුලි අවශ්‍යතා සපුරා ගැනීම.**

ii. සූර්ය ශක්තිය භාවිත කරමින් ශක්තිය පරිවර්තනය කර ප්‍රයෝජනයට ගන්නා පහත අවස්ථා නම් කරන්න.




සූර්ය ශක්තිය පුනර්ජනනීය ශක්ති විශේෂය කි.

ආලෝක ශක්තිය විද්‍යුත් ශක්තිය බවට පත් කර නිවෙස්වල විදුලි අවශ්‍යතා සපුරා ගැනීම.

# ජෛව ස්කන්ධ

ප්‍රභාසංස්ලේෂණය මගින් සූර්ය ශක්තිය ශාක තුළ තිර කරනු ලබයි. එම ශක්තිය ශාක තුළ රසායනික ශක්තිය ලෙස ගබඩා වී පවතී. මෙම ශාක සතුන් ආහාරයට ගත් විට එම රසායනික ශක්තිය සතුන් තුළ ගබඩා වී පවතී. එසේ ශක්තිය ගබඩා වී ඇති ඉන්ධනයක් ලෙස භාවිත කළ හැකි ජීව දේහ (ශාක හා සත්ත්ව) කොටස් **ජෛව ස්කන්ධ** ලෙස හඳුන්වයි.

a. ශ්‍රී ලංකාවේ භාවිතයට ගන්නා ජෛව ස්කන්ධ සඳහා නිදසුන් තුනක් දෙන්න.

**තාපය ලබා ගැනීම සඳහා**

- දර
- පොල් කටු
- දහයියා/ ලී කුඩු

**ජීව වායුව නිපදවීම සඳහා**

- පිදුරු/ගොම/නරක් වූ ආහාර හා එළවළු,


## b. ජෛව ස්කන්ධ ශක්ති ප්‍රභවයක් ලෙස භාවිතයට ගන්නා කුඩු ලිපක් නිර්මාණය කරන ආකාරය පියවර වශයෙන් දක්වන්න.

පෙළ පොත 54 පිටුව බලන්න.

- ..........
- ..........
- ..........
- ..........
- ..........
- ..........


ක්‍රමය :

- පියන රහිත ටින් එකේ පතුලට ආසන්නව 4 cm පමණ විෂ්කම්භය ඇති වෘත්තාකාර සිදුරක් කපා ඉවත් කරන්න.
- PVC බටය වෘත්තාකාර සිදුරෙන් ටින්එක තුළට යවන්න. එය ටින්එකේ මැද දක්වා තල්ලුකර 4 cm පමණ පිටතට සිටින පරිදි කපාගන්න.
- තවත් PVC බට කැබැල්ලක් ගෙන එය ටින්එක තුළ සිටුවා තබාගෙන ටින්එක ලී කුඩු හෝ දහයියාවලින් පුරවන්න.
- ලී කෑල්ලකින් තෙරපමින් ලී කුඩු / දහයියා හොඳින් සිරකරගන්න.
- PVC බට දෙක පරෙස්සමෙන් ඉවතට ගන්න.
- ටින්එක තුළ L හැඩැති සිදුරක් නිර්මාණය වී ඇත. මෙම සිදුරේ පහත කෙළවරෙන් දැල්ලක් ඇතුල්කර කුඩු ලිප දැල්විය හැකි ය.



4.10 රූපය

c. කුඩු ලිපක් භාවිතයේ ඇති වාසියක් සහ අවාසියක් සඳහන් කරන්න.



- වාසියක්:
- වියදම් අඩු සරල ක්‍රමයක් වීම.
- අවාසියක්:
- අවශ්‍ය අවස්ථාවල දි ලිප නිවීම හා යළි දැල්වීම අපහසු වීම.

## d. පහත සඳහන් ජෛව ස්කන්ධ භාවිත කරන අවස්ථාවක් බැගින් සඳහන් කරන්න.

- දර : ආහාර පිසීම, ගඩොල් /උළු පිළිස්සීම
- දහයියා : කුඩු ලිප සඳහා / වී තැම්බීම සඳහා
- පොල් කටු අගුරු: කුඩු ලිප සඳහා / වී තැම්බීම සඳහ
- පිදුරු: වළං පිළිස්සීම සඳහා

**ජෛව ස්කන්ධ පුනර්ජනනීය ශක්ති ප්‍රභවය කි.**

# පොසිල ඉන්ධන

ශාක හා සත්ත්ව දේහ පොළව යට වැළලී අවුරුදු දහස් ගණනක් අධික උෂ්ණත්වය, පීඩනය හා විවිධ විපර්යාසයන්ට ලක්වීමෙන් පොසිල ඉන්ධන නිර්මාණය වේ. එබැවින් පොසිල ඉන්ධනවල මූලික ප්‍රභවය ද සූර්යයා ම වේ.

a. පොසිල ඉන්ධන සඳහා නිදසුන් තුනක් දෙන්න.

- පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්

b. දැනට ශ්‍රී ලංකාවේ ගල් අඟුරු භාවිතයට ගන්නා අවස්ථාවක් සඳහන් කරන්න.

- තාප බලාගාරවල විදුලිය නිපදවීමට

c. බොරතෙල්වලින් භාවිතය සඳහා සකසා ගන්නා ඉන්ධන වර්ග පහක් සඳහන් කර භාවිත අවස්ථාව බැගින් ලියන්න.

- පෙට්‍රල් - යතුරු පැදි, කාර් ධාවනයට
- ඩීසල් - වෑන්, ලොරි, ට්‍රැක්ටර්, බස්රථ ධාවනයට
- භූමිතෙල් - කුප්පි ලාම්පු දැල්වීමට
- එල්.පී වායුව - ආහාර පිසීමට
- ගුවන් යානා තෙල් - ගුවන් යානා සඳහා

d. ලෝකයේ ගල් අඟුරු බහුලව ඇති රටවල් තුනක් සඳහන් කරන්න.

- චීනය
- ඇමරිකා එක්සත් ජනපදය
- ඉන්දියාව
- ඕස්ට්‍රේලියාව

e. ලෝකයේ බොරතෙල් නිධි බහුලව ඇති රටවල් තුනක් සඳහන් කරන්න.

- ඉරානය
- ඉරාකය
- සෞදි අරාබිය
- ක්වේට්

පොසිල ඉන්ධන පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභවය කි.

## සුළඟේ ශක්තිය

v. සූර්ය තාපය හේතුවෙන් රත්වූ වාතය ඉහළට යයි. එම අවකාශ පිරවීමට සාමාන්‍ය වාතය එතැනට එයි. සුළං ඇති වන්නේ ඒ ආකාරයට ය. එබැවින් සුළං සතුව පවතින්නේ ද සූර්ය ශක්තිය යි.

a. සුළං සතුව පවතින ශක්ති ප්‍රභේදය කුමක් ද?

- සුළගේ ශක්තිය

b. සුළඟේ ශක්තිය සාමාන්‍ය ජීවිතයේ දී ප්‍රයෝජනවත් ලෙස යොදා ගන්නා අවස්ථා තුනක් සඳහන් කරන්න.

- වී/බැත සුළං කිරීම.
- සරුංගලය ඉහළ යැවීම.
- විදුලිය නිපදවීම.

## c. සුළගේ ශක්තිය යොදාගන්නා පහත අවස්ථාව නම් කරන්න.





- සුළංබලාගාර මගින් විදුලිය නිපදවීම.

d. ශ්‍රී ලංකාවේ සුළං බලයෙන් විදුලිය නිපදවන බලාගාර පිහිටන ස්ථාන තුනක් සඳහන් කරන්න.

- හම්බන්තොට
- පුත්තලම
- නොරොච්චෝලෙයි

සුළඟ පුනර්ජනනීය ශක්ති ප්‍රභවය කි.

# ගලායන ජලයේ ශක්තිය

උස් ස්ථානයක පිහිටි ජලාශයක ඇති ජලය සතුව පවතින්නේ විභව ශක්තිය යි. ජලය එම උස් ස්ථානයට ගමන් කිරීමට හේතු වූයේ සූර්ය ශක්තියෙන් ජලාශවල ඇති ජලය වාෂ්ප වී වර්ෂාව බවට පත්ව යළි පොළව මතට පතිත වීම හේතුවෙනි. ඒ අනුව ජලය සතු ශක්තියේ ද මූලික ප්‍රභවය වන්නේ සූර්යයා මය.

උස් බිමක පිහිටි ජලය පහත් බිමක් දක්වා ගමන් කරන විට ජලයේ විභව ශක්තිය චාලක ශක්තිය බවට පරිවර්තනය වේ. එම චාලක ශක්තියෙන් තලබමනයක් කරකවා ඊට සම්බන්ධ ඩයිනමෝවක් කරකැවීමෙන් විදුලි බලය නිපදවනු ලබයි. එසේ නිපදවනු ලබන විදුලිය " ජල විදුලිය " ලෙස හඳුන්වනු ලබයි.


ජල ටර්බයිනයක
(තලබමනයක) ආකෘතියක්
තනා එමගින් මෝටරයක්
කරකැවීමෙන් විදුලිය
නිපදවා ගත හැකිය.
එම ක්‍රියාකාරකම පියවර
වශයෙන් මෙසේ දැක්විය
හැකිය.



# 6 ශ්‍රේණිය - එදිනෙදා ජීවිතයේ දී ශක්තිය

- විෂ්කම්භය 14 cm පමණ ද උස 10 cm පමණ ද වූ බිස්කට් ටින් එකකට බෝල්ට් ඇණ මගින් ප්ලාස්ටික් මෙගා බෝතල් මූඩි 8 ක් සම දුරින් සවි කර ගැනීම.
- බෝතල් මූඩි ටින් බඳුනේ මධ්‍යයට නොව තරමක් අයිනට වන්නට සවි කිරීම.
- (12 V කාර් කැසට්) මෝටරයක් කරකැවීමට හැකිවන සේ ටින් බඳුන ටවරින් නූලක් අධාරයෙන් සම්බන්ධ කිරීම.
- මෝටරයට LED එකක් සම්බන්ධ කර බෝතල් මූඩිවලට ජල පහරක් ඇල්ලීම.







12 V මෝටරය

- ලැබිය හැකි නිරීක්ෂණ මොනවා ද?




- තලබමනය,මෝටරය කරකැවේ.
- LED ය දැල්වේ.



- මෙහි දී සිදු වූ කාර්යය කුමක් ද?



- LED ය දැල්වීම





- කාර්යය සිදු කළ ශක්ති ප්‍රභේදය කුමක්ද ?

- ගලා යන ජලය

*ගලා යන ජලය පුනර්ජනනීය ශක්ති ප්‍රභවය කි.*

## වෙනත් ශක්ති ප්‍රභව


vii. පහත රූපසටහන් මගින් දැක්වෙන ශක්ති ප්‍රභවය හඳුනාගන්න පහළ වූ කොටුවේ ප්‍රභවය හඳුන්වන නම ලියන්න.






- මුහුදු රළ

# වෙනත් ශක්ති ප්‍රභව




- උදම් රළ

## වෙනත් ශක්ති ප්‍රභව




- න්‍යෂ්ටික බලය

# වෙනත් ශක්ති ප්‍රභව



Geothermal Power Plant




- **භූ තාපය**

02. මිනිසාගේ ශක්ති අවශ්‍යතා දිනෙන් දිනම ඉහළ යමින් පවතී. එබැවින් මෙතෙක් භාවිත කළ ශක්ති ප්‍රභවවලට අලුතින් ශක්ති ප්‍රභව සොයා ගත යුතුව ඇත. එසේම ශක්ති ප්‍රභව භාවිතයේ දී අවධානය යොමු කළ යුතු වැදගත් කරුණක් වන්නේ ශක්ති සම්පත් අරපිරිමැස්මෙන් යුතුව භාවිත කිරීම යි.

i. මිනිසාගේ ශක්ති අවශ්‍යතා ඉහළ යාමට හේතු පහක් සඳහන් කරන්න.

- ජනගහනය වැඩි වීම
- මිනිසාගේ අවශ්‍යතා වැඩි වීම.
- කාර්ය පහසුවෙන් සිදුකිරීමට උපකරණ තැනීම.
- තාක්ෂණයේ දියුණුව
- සිදුකරන කාර්යයවල ගුණාත්මක බව දියුණු වීම.

ii. ශක්තිය අරපිරිමැස්මෙන් භාවිත කිරීම පෞද්ගලිකව ආර්ථික වාසියකි. එසේම එය ජාතික වගකීමකි. ඔබට බල ශක්තිය තිරසාර ලෙස භාවිත කළ හැකි ආකාර පහක් සඳහන් කරන්න.


a. අනවශ්‍ය අවස්ථාවල විදුලි පහන් නිවා දැමීම

b. ස්වභාවික ශක්තිය උපරිමයෙන් භාවිත කිරීම.

c. සූත්‍රිකා පහන් වෙනුවට LED පහන් යොදා ගැනීම.

d. ශීතකරණය විවෘත කරන වාර ගණන අඩු කිරීම.

e. මැදීමට ඇති රෙදි එකවර මැද ගැනීම.


Global Energy Potential
Solar 23,000 TW
Tidal 0.3 TW
Wave 0.2–2 TW
Geothermal 0.3–2 TW
Hydro 3–4 TW
Biomass 2–6 TW
Wind 25–70 TW
World Energy consumption 16 TW
Coal
900 TW-yr
Uranium
90–300 TW-yr
Oil
240 TW-yr
Natural gas
215 TW-yr
annually
total reserves

## ඔව් , දැන් මට පුළුවන් ! Yes , I Can !

- කාර්යය කිරීමේ හැකියාව ශක්තිය ලෙස හැඳින්වීමට
- ප්‍රධානතම ශක්ති ප්‍රභවය සූර්යයා ලෙස නම් කිරීමට
- සුළඟ, පොසිල ඉන්ධන, ගලායන ජලය ශක්ති ප්‍රභව සරලව හැඳින්වීමට
- සූර්යයා, සුළඟ, ජලය වැනි ශක්ති ප්‍රභවවල භාවිත විදහා දැක්වීමට ආකෘති නිර්මාණය කිරීමට
- විකල්ප ශක්ති ප්‍රභව කිහිපයක් නම් කිරීමට
- ශක්ති ප්‍රභවවල එලදායී යෙදීම් කිහිපයක් සඳහන් කිරීමට

- ශක්ති ප්‍රභවවල ඵලදායී යෙදීම් කිහිපයක් සඳහන් කිරීමට
- ශක්ති අර්බුදයට හේතු විය හැකි කරුණු ඉදිරිපත් කිරීමට
- ශක්ති අර්බුදයට පිළියම් යෝජනා කිරීමට
- ශක්තිය නිරසාර ලෙස භාවිත කළ යුතු බව පිළිගැනීමට

# එදිනෙදා ජීවිතයේ දී ශක්තිය

**Yes! I Can**

L. Gamini Jayasuriya - ISA Science

ඉදිරිපත් කිරීම

එල්. ගාමිණි ජයසූරිය

ගුරු උපදේශක (විද්‍යාව)

වෙන්/කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයය

ලුණුවිල.

*071 4436205 / 077 6403672*